# ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 27 දරන කොළඹ දිස්ත්‍රික්කයේ (පහත් බිම් ප්‍රදේශ) ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1976 දෙසැම්බර් මස 3 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

(1976 දෙසැම්බර් මස 24 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදි

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක

## ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 27 දරන කොළඹ දිස්ත්‍රික්කයේ (පහත් බිම් ප්‍රදේශ) ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1976 දෙසැම්බර් මස 3 වන දින]

එල්. ඩී.—ඕ. 14/75

1968 අංක 15 දරන කොළඹ දිස්ත්‍රික්කයේ (පහත් බිම් ප්‍රදේශ) ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය.

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක 27 දරන කොළඹ දිස්ත්‍රික්කයේ (පහත් බිම් ප්‍රදේශ) ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

1968 අංක 15 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

2. (මෙහි මින් මතු " ප්‍රධාන ප්‍රඥප්තිය " යනුවෙන් සඳහන් කරනු ලබන) 1968 අංක 15 දරන කොළඹ දිස්ත්‍රික්කයේ (පහත් බිම් ප්‍රදේශ) ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ මණ්ඩල පනතෙහි 3 වන වගන්තිය, ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත සඳහන් අලුත් උපවගන්තිය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

" (2) (1) වන උපවගන්තියෙහි සහ 3අ වන වගන්තියෙහි විධිවිධාන ක්‍රියාත්මක වීමේ හේතුවෙන් මණ්ඩලය වෙත සතුවන යම් ඉඩමක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින්, 4අ වන වගන්තියෙහි විධිවිධාන සලසා ඇති පරිදි හැර කිසිම වන්දියක් ගෙවනු නොලැබිය යුතු ය. ".

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 3අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

3. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 3 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියෙහි 3අ වන වගන්තිය ලෙස බලපවත්වන්නේ ය:—

'රජයේ ඉඩම්, මණ්ඩලය වෙත පැවරීම.

3අ. (1) පහත් බිමක්, මඩ වගුරක්, මුඩු බිමක් හෝ වගුරු බිමක් වූ ද 2 වන වගන්තිය යටතේ වූ නියමයකින් ප්‍රකාශිත ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ ප්‍රදේශයක් තුළ පිහිටියා වූ ද යම් රජයේ ඉඩමක් යම් ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ ව්‍යාපාරයක් සඳහා මණ්ඩලයට ලබා දීම අවශ්‍ය යයි අමාත්‍යවරයා සහතික කරන අවස්ථාවක, රජයේ ඉඩම් ආඥාපනතෙහි හෝ වෙනත් යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද, අමාත්‍යවරයා විසින්, රජයේ ඉඩම් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන (මෙහි මින් මතු " සතු කිරීමේ නියමය " යනුවෙන් මේ පනතෙහි සඳහන් කරනු ලබන) නියමයක් මගින් ඒ නියමයෙහි සඳහන් කරනු ලබන යම් දිනයක සිට ඒ ඉඩම මණ්ඩලය සතු කළ හැකි ය.

2—ඒ 22830 –12,300 (76/09)

(2) සතු කිරීමේ නියමයක සඳහන් යම් ඉඩමක් පිළිබඳ පරම අයිතිය ඒ නියමයෙහි සඳහන් දින යෙහි සිට සියලු බැඳීම්වලින් තොරව මණ්ඩලය වෙත ලබාදීමේ බලපෑම ඒ නියමයෙහි ඇත්තේ ය.

(3) යම් රජයේ ඉඩමක් මණ්ඩලය සතු කිරීමෙන්, ඒ ඉඩමෙහි, ඒ ඉඩම මත හෝ ඒ ඉඩම යට ඇති යම් ඛනිජ ද්‍රව්‍යයක්, ඛනිජ ද්‍රව්‍ය නිෂ්පාදනයක් හෝ ඛනිජ තෙල් කෙරෙහි අයිතියක් පැවරේ නැයි නොසැලකිය යුතු අතර, එවැනි යම් සතු කිරීමක් නොතකා, එවැනි යම් ඛනිජ ද්‍රව්‍යයක්, ඛනිජ ද්‍රව්‍ය නිෂ්පාදනයක් හෝ ඛනිජ තෙල් ජනරජයේ පරම දේපළ වශයෙන් පැවතෙන ලෙස හා පැවතිය යුතු ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) යම් රජයේ ඉඩමක් මණ්ඩලය සතු කළ යුතුව ඇති අවස්ථාවක ඒ ඉඩම සම්බන්ධයෙන් මැනුම් දෙපාර්තමේන්තුව විසින් සකස් කරනු ලැබූ පිඹුරක් නොමැති නම්, මණ්ඩලයේ සභාපති විසින්, මැනුම්පති විසින් අනුමත කරන ලද බලයලත් මිනින්දෝරුවකු ලවා ඒ ඉඩම මත්තාවා පිඹුරක් සාදවා ගැනීමට සැලැස්විය හැකි ය.'.

Iඅ වන අලුත් කොටස ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියෙහි I වන කොටසට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් කොටස මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ Iඅ වන කොටස ලෙස බලපවත්වන්නේ ය :—

**"Iඅ වන කොටස**

**මණ්ඩලය විසින් ඉඩම් විකිණීම**

මණ්ඩලය සතු කරනු ලැබූ හෝ මණ්ඩලය විසින් අත් කරගනු ලැබූ ඉඩම් විකිණීමේ අයිතිය.

4අ. රජයේ ඉඩම් ආඥාපනතෙහි හෝ වෙන යම් ලිඛිත නීතියක කුමක් සඳහන් වුව ද 3 වන වගන්තිය, 3අ වන වගන්තිය හෝ 4 වන වගන්තිය යටතේ මණ්ඩලය සතු කරනු ලැබූ හෝ මණ්ඩලය විසින් අත් කර ගනු ලැබූ යම් ඉඩමක් නිවාස විෂයය භාර අමාත්‍යවරයා, කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයා සහ පළාත් පාලන විෂයය භාර අමාත්‍යවරයා විමසීමෙන් පසුව අමාත්‍යවරයා විසින් දෙනු ලබන අනුමතය ඇතිව, යම් නිවාස, වාණිජ, කර්මාන්ත හෝ කෘෂිකාර්මික කටයුත්තක් සඳහා මණ්ඩලය විසින් විකුණනු ලැබිය හැකි ය.

සතු කරනු ලැබූ ඉඩමෙහි ගොඩ කිරීමට පෙර වටිනාකම මණ්ඩලය විසින් පළාත් පාලන ආයතනයට හෝ ඉඩම් කොමසාරිස්ට ගෙවිය යුතු බව.

4ආ. 3 වන වගන්තිය හෝ 3අ වන වගන්තිය යටතේ මණ්ඩලය සතු කර ගනු ලැබූ යම් ඉඩමක් විකුණනු ලබන අවස්ථාවක, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන, ගොඩ කිරීමට පෙර ඒ ඉඩමෙහි වටිනාකම මණ්ඩලය විසින් අවස්ථාවෝචිත පරිදි පළාත් පාලන ආයතනයට හෝ ඉඩම් කොමසාරිස්ට හෝ ගෙවනු ලැබිය යුතු ය. ".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියෙහි (අ) ඡේදය වෙනුවට පහත සඳහන් අලුත් ඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය සංශෝධනය කිරීම.

" (අ) 2 වන වගන්තිය යටතේ වූ නියමයක් මඟින් ප්‍රකාශිත සෑම ගොඩ කිරීමේ සහ සංවර්ධනය කිරීමේ ප්‍රදේශයක් ම ගොඩ කොට සංවර්ධනය කිරීම සහ ඒ ප්‍රදේශය යම් ගොඩ නැගිලි, කාර්මික, වාණිජ හෝ කෘෂිකාර්මික කටයුත්තක් සඳහා යෝග්‍ය තත්ත්වයකට පත් කිරීම ; සහ ".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය මෙයින් ප්‍රතියෝජනය කරනු ලබන අතර ඒ වෙනුවට පහත සඳහන් අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ :— ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය ප්‍රතියෝජනය කිරීම.

" මණ්ඩලයේ ප්‍රාග්ධනය.

11. (1) මණ්ඩලයේ ආරම්භක ප්‍රාග්ධනය—

(අ) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නියම හා කොන්දේසි මත ආණ්ඩුව විසින් දෙනු ලැබූ හෝ ලැබීමට සැලැස් වූ ආධාර මුදල් වලින් හෝ ණය මුදල්වලින් සමන්විත රුපියල් දස ලක්ෂයක් ; සහ

(ආ) යම් ආණ්ඩුවේ දෙපාර්තමේන්තුවක් හෝ සංස්ථාවක් විසින් ඒ දෙපාර්තමේන්තුව හෝ සංස්ථාව භාර අමාත්‍යවරයාගේ නියමයකින් හෝ ඒ අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මණ්ඩලය වෙත පවරනු ලබන දේපළවල වටිනාකම

වන්නේ ය.

(2) මණ්ඩලයේ ආරම්භක ප්‍රාග්ධන මුදල, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් අමාත්‍යවරයා විමසා නිශ්චය කරනු ලබන වාරිකවලින් මණ්ඩලය වෙත ගෙවනු ලැබිය යුතු ය ; නැතහොත් මණ්ඩලයට ලැබීමට සැලැස්විය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයෙන් විධිවිධාන සලසා ඇති පරිදි මණ්ඩලය වෙත පවරනු ලබන යම් දේපළක වටිනාකමින් සහ යම් විසර්ජන පනතකින් හෝ ජාතික රාජ්‍ය සභාවේ යම් යෝජනා සම්මතයකින් බලය දෙනු ලබන මුදල් ප්‍රමාණයක්ගෙන් මණ්ඩලයේ ප්‍රාග්ධනය කලින් කල වැඩි කළ හැකි අතර මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන නියම හා කොන්දේසි මත ආණ්ඩුව විසින් ආධාර මුදලක් හෝ ණය මුදලක් වශයෙන් ඒ මුදල් ප්‍රමාණයන් මණ්ඩලය වෙත ගෙවනු ලැබිය යුතු ය ; නැතහොත් මණ්ඩලයට ලැබීමට සැලැස්විය යුතුය.".